

# 10th Cub Holiday camp
## Colombo District 2021
## Drama Songs



ගල්ලෙන බිදලා ලෙන්දොර ඇරලා

සිංහබා සිංහබා සිංහබා

මා සොදුර මා සොදුර මා සොදුර
සිංහ සීවලී මා ප්‍රිය දියණිය
ගල්ලෙන බිදලා ලෙන්දොර ඇරලා
ගොසින් සැමදෙන නැතේ කිසිවෙක්
මම දැන ගතිමි මම සැක කලෙමි
සිංහබා සිංහබා සිංහබා

ලෙන තුල නොවෙති
පෙරලා නොඑති
මම දැන ගතිමි මම සැක කලෙමි
සුරතල් දියණිය මොලකැටි වදනින් මා සනසන්නිය
අහර පිසන්නිය
සුරතල් දියණිය මොලකැටි වදනින් මා සනසන්නිය
අහර පිසන්නිය

කවන්නිය පොවන්නිය මා ගැන බිය වන්නිය
වනයේ දුකක් විද අසන්නිය සොයන්නිය
කවන්නිය පොවන්නිය මා ගැන බිය වන්නිය
වනයේ දුකක් විද අසන්නිය සොයන්නිය

ඈත් ගොසින්ය ඈත් ගොසින්ය
ඇයි සුදු දුවනියෙ නුඹවත් නොසිටියෙ
ඇයි සුදු දුවනියෙ නුඹවත් නොසිටියෙ
සොහොයුරානම් ඔල මොල ගති ඇත නුඹ මෙන් මෘදු නැත
සොහොයුරානම් ඔල මොල ගති ඇත නුඹ මෙන් මෘදු නැත
ඔහුගේ අණටද කීකරු වූයේ පෙරලා එන්නෙද ඔහුගෙන් ගැලවී
ඔහුගේ අණටද කීකරු වූයේ පෙරලා එන්නෙද ඔහුගෙන් ගැලවී

පොම්බුලේ මගේ පොම්බුලේ
තාරාදේවි පොම්බුලේ
බේරාගන්නම් පොම්බුලේ මගේ
වාල් රජාගේ පොම්බුලේ
තාරාදේවි පොම්බුලේ
නාන්න ඇවිදින් ගගට බහින කොට
තාරාදේවි එක්කල
රාමස්සාමිගේ රාමසැරෙන් මම
සුන්දර වන්නම් //
පොම්බුලේ මගේ පොම්බුලේ
තාරාදේවි පොම්බුලේ
බේරාගන්නම් පොම්බුලේ මගේ
වාල් රජාගෙන් පොම්බුලේ
තාරාදේවි පොම්බුලේ
නාන තොටේ හෙට
දිය යට ගින්දර මතු කරවන්නේ මේ
හනුමන්
වාලි ඔටුන්නෙන් සැරසී හෙට සිට
සිංහාසනයෙන්//
පොම්බුලේ මගේ පොම්බුලේ
තාරාදේවි පොම්බුලේ
බේරාගන්නම් පොම්බුලේ මගේ
වාලි රජාගෙන් පොම්බුලේ
තාරාදේවි පොම්බුලේ
වදුරු වලස්සෙන් ගෙනදී රාමට
රාවණ යුද්දේ අවුලන්නෝ
පුළුවන් වුවහොත් විභිෂණ රවටා
ලංකාවත් අපි අල්ලන්නම් //
පොම්බුලේ මගේ පොම්බුලේ
තාරාදේවි පොම්බුලේ
බේරාගන්නම් පොම්බුලේ මගේ
වාල් රජාගෙන් පොම්බුලේ
තාරාදේවි පොම්බුලේ ///

[ හනික වරෙව් කොල්ලනේ මෙන්න මෙහෙ වරෙව්//
මෙන්න මෙහෙ වරෙව් කොල්ලනෙ නට නටා වරෙව්//
තොපිට හරිම වාසියක් නට නටා වරෙව්...// ]//
යකෝ තොපිට හරිම වාසියක් නට නටා වරෙව්...

වැඬේ අමාරුත් නැතේ තෑගි ටිකත් අපි අතේ//
රත්තරනින් එවන්නේ හිරු දෙවියොයි කියන්නේ...////

මෙන්න මෙහෙ වරෙව් කොල්ලනෙ නට නටා වරෙව්//
තොපිට හරිම වාසියක් නට නටා වරෙව්...//
යකෝ තොපිට හරිම වාසියක් නට නටා වරෙව්
හනික වරෙව් කොල්ලනේ මෙන්න මෙහෙ වරෙව්...//

සාදු සාදු කියල්ලා ප්‍රීති ඝෝෂ කරල්ලා//
හිරු දෙවිඳුගෙ ගොපල්ලෝ කන්ද උඩින් වරෙල්ලා
හිරු දෙවිඳුගෙ ගොපල්ලෝ කන්ද යටින් වරෙල්ලා
හිරු දෙවිඳුගෙ හරක් ගත්තු හරක් හොරා හොයල්ලා//
ලෝකෙ වටේ ගොහිල්ලා හරක් හොරා හොයල්ලා//
හිරු දෙවිඳුගෙ හරක් ගත්තු හරක් හොරා හොයල්ලා....//

වනාන්තරේ සොයාපියෝ ගල් අරඹේ සොයාපියෝ
මරු කතරේ සොයාපියෝ මිනිස් වාසෙ සොයාපියෝ
කඳු මුදුනේ ගං ඉවුරේ වනාන්තරේ සොයාපියෝ//
හිරු දෙවිඳුගෙ ගොපල්ලො අපි අපිට දෙවියො බලාපියෝ....//
රන් අඹරණ පැළඳගත්ත මහ පොළොවේ රන් වපුරන//
හිරු දෙවියො බලාපියෝ///
හරක් හොරා හොයාගන්න සියලු දෙවියො පිහිටවෙයෝ....//

දීකිරි දීකිරි ගෙනාව දීකිරි
මිහිපිට කාටත් ගුණ දෙන දීකිරි...//

පැටියා මෝරපු දෙණ ගෙන් ගත් කිරි
හොඳ හැටි උණු කොට හින්දාගත් කිරි
නැවුම් මුට්ටියේ වත්කල මේ කිරි
පණාමට ලාබයි මං දෙන මේ කිරි

දීකිරි දීකිරි ගෙනාව දීකිරි....

කිරි විකුණාලා කාසි හොයන්නයි
අනාගතේ මාළිගා තනන්නයි
කුමාරයෙක් ගෙදරට කැන්දන්නයි
මුට්ටිය බිඳුනොත් ඔක්කොම ඉවරයි

දීකිරි දීකිරි ගෙනාව දීකිරි....

හිස මගේ දෙදරයි දෙපා රුදා දෙයි
රෑ වෙන්නට පෙර ගෙදරට යන්නයි
පණාමේ කිරි ගෙන පිහිටක් වෙන්නයි
මගේ මංගල්ලෙට ඔහෙලත් එන්නයි

දීකිරි දීකිරි ගෙනාව දීකිරි..../ / /

**ප්‍රේමයෙන් මන රංජිත වේ**
**නන්දිත වේ**
**පුෂ්පයෙන් වන සුන්දර වේ**
**ලංකෘත වේ**
**ආලයෙන් වෙලි සැදි මේ ලතා//**
**මණ්ඩපයෙන් චන්ඩා තප**
**ඛණ්ඩිත වේ හිරු රජිඳුගෙ//**

**ප්‍රේමයෙන් මන රංජිත වේ.....**
**කෝකිල හඬ කන් පිනවයි**
**රන් ස්වරයයි**
**රෑන ගිරව් දෙන**
**ගී සිංදු අම බිංදු**
**සෑම දෙසේ සංගීත ඇසේ**
**පිපි තඹරින් නද බඹරින්**
**පිය රැව් දෙන ලිය කිඳුරන**
**කෝකිල හඬ කන් පිනවයි.....**

